අ.පො.ස උසස් පෙළ

# පෙරදිග සංගීතය



## ශ්‍රී ලංකාවේ ගැමි නාට්‍ය

# පෙරදිග සංගීතය

## සොකරි

- ❖ සොකරි යනු ගැමි නාටක ශෛලියකි.
- ❖ මෙය පැරණිතම ගැමි නාට්‍ය ලෙසද සැලකේ.
- ❖ පත්තිනි දෙවියන් හා සම්බන්ධ වේ.
- ❖ රංග භූමිය ලෙස කමත භාවිතා කරයි.
- ❖ කෘෂිකර්මාන්තය හා සම්බන්ධ සශ්‍රීකත්වය හා බැඳි නාට්‍යයකි.

ඒ සඳහා උදාහරණ ලෙස පහත කරුණු ගත හැකිය.

- කමත රඟ මඬල ලෙස යොදා ගැනීම.
- වඳ ස්ත්‍රියක් වූ සොකරියට දරු ඵල ලැබීම.
- කමතෙහි පොල්මලක් ඉහිරෙන ලෙස කරනු ලබන රංගනය
- මෙහි කතා පුවත පළාත්බදව සුළු වශයෙන් වෙනස්කම් දැකිය හැකිය.
- උඩරට පළාත, වන්නිය සහ සතර කෝරළයේ ඇතැම් පෙදෙස්වල ප්‍රචලිත වී ඇත.
- සොකරි නාටකයේ මුල් ස්වරූපය තවම රඳා පවතින්නේ ලග්ගල, ඉළුක්කුඹුර, බදුල්ල වැනි ප්‍රදේශ වලයි.

## නාට්‍යමය ලක්ෂණ

- ❖ අනුරූපණ මාධ්‍යයෙන් කතාවක් කීම මෙහි විශේෂ ලක්ෂණයකි. (එනම් කණ්ඩායම් නායකයා (බෙරකරු) කිසියම් සිද්ධියක් කවියෙන් විස්තර කරන විට නළුවෝ එය අනුකරණාත්මක නැටුමෙන් රඟ දක්වති.)
- ❖ ගද්‍ය සංවාද දක්නට ඇත.
- ❖ සොකරි නාට්‍ය රාත්‍රී 07 ක් පමණ දීර්ඝ කාලයක් රඟ දක්වයි.
- ❖ සියළු චරිත පිරිමින් විසින් රඟ දක්වනු ලැබේ.

අන්තර්ගතය - එල්.පී.කේ.එච්. පතිරත්න - ගුරු උපදේශක, නක්කවත්ත කොට්ඨාශය, ගිරිඋල්ල.

සැකසුම - ජී.ඩී.සී.එන්. ගමගේ මෙය - මො/මල්ලවත්තාවල ජාතික පාසල, වැල්ලවාය

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# පෙරදිග සංගීතය

- ❖ සමහර චරිත කොළපත් වලින් සාදා වෙස්මුහුණු පළඳිති.
- ❖ ශාන්ති කර්ම අංග මෙම නාටකයෙහි ඇතුලත් වී ඇති බව දැකිය හැකිය. එයට උදාහරණ ලෙස,
  - පත්තිනි දෙවියන් හා සම්බන්ධ කථා පුවත
  - නැති වූ සොකරිය සොයා ගැනීමට කතරගම දෙවියන්ගෙන් පිහිට පැතීම.
  - නාට්‍ය අවසානයේ දේවදානයක් පිරිනැමීම වැනි කරුණු ගත හැකිය.
- ❖ බෙරකරු,සොකරි,ගුරුහාමි,පරයා,වෙදරාළ,සොන්තානා යන චරිත මෙම කථා පුවත තුල ඇතුලත්ය.

## සංගීතමය ලක්ෂණ

- ❖ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ගැටබෙරය වේ.
- ❖ ගී තනු රටා උඩරට ශාන්ති කර්ම හා සම්බන්ධ වේ.
- ❖ ඇතැම් ප්‍රදේශවල තාල වාදනය සඳහා දවුලද, වන්නියේ උඩැක්කියද යොදා ගනී.
- ❖ ගී තනු පටු ස්වර ක්ෂේත්‍රයක් මත ගායනා කරයි.
- ❖ ඒකාකාරී නාදමාලාවකින් යුක්ත වේ.



The National e-learning Portal for The General Education

Copyright © e-thaksalawa.moe.gov.lk